# දකුණු පළාත් සභාව
# රුහුණු සංචාරක කාර්යාංශය
# තනතුරු පුරප්පාඩු

රුහුණු සංචාරක කාර්යාංශයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනමින් මාස 06 ක කාල සීමාවක් සඳහා (සටුතුදායක සේවය මත සේවා දීර්ඝ කිරීම් හිමි වේ.) බඳවා ගැනීමට 2025. 07. 16 දින ප.ව.4.00 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. <u>කළමනාකාර අධ්‍යක්ෂ (MM 1 – 1 ) (තනතුරු 01)</u>

**<u>සුදුසුකම්</u>**

<u>බාහිර අයදුම්කරුවන්</u>

සංචාරක විෂය ක්ෂේත්‍රය හා කළමනාකරණ විෂය ද ඇතුළුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු සංචාරක විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

සහ

ඉංග්‍රීසි භාෂාව හැසිරවීම පිළිබඳ මනා හැකියාවක් තිබිය යුතුය.

සහ

ප්‍රජා සම්බන්ධතාවය සහ මනා සන්නිවේදන කුසලතාවයකින් යුක්ත වීම.

<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
02. "**කනිෂ්ඨ කළමනාකාර**" JM සේවා ශ්‍රේණියෙහි අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් අවුරුදු 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**<u>වෙනත් :-</u>**

**සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

1. පූර්වාසන්න වසර තුන (03) ක කාලය තුළ දකුණු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**<u>වයස :-</u>**

අවු: 22 ට නොඅඩු හා අවු: 65 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

<u>වැටුප **:-**</u> රු. 91,960/= + දීමනා

**<u>කොන්ත්‍රාත් කාල සීමාව :-</u>**

මාස 06 ක කාලයක් සඳහා (සටුතුදායක සේවය මත සේවා දීර්ඝ කිරීම් හිමි වේ.)

**<u>බඳවා ගැනීමේ ක්‍රමය :-</u>**

ආයතනයෙහි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි පුවත්පත් දැන්වීමකින් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මඟින් සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින් ඉල්ලුම්පත් කැඳවා පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**<u>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-</u>**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීම පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම් | ලකුණු 30 |
| අනෙකුත් කුසලතා / කාර්ය සාධනය | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | 100 |

සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලැබේ.

**<u>සුදුසුකම් ලබන දිනය</u>**

සේවයට / තනතුරට පත් කිරීම සඳහා වන බඳවා ගැනීමේ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණකි.

<u>අයදුම්පත් ක්‍රියාපටිපාටිය</u> **:-**

1. පුරප්පාඩු තනතුරු සම්බන්ධයෙන් සියලුම තොරතුරු රුහුණු සංචාරක කාර්යාංශයේ වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබා ගත හැකි අතර අදාළ අයදුම්පත් එම වෙබ් අඩවියෙන් බාගත කර ගත යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත **සභාපති, රුහුණු සංචාරක කාර්යාංශය, 153බී, එස්.එච්.දහනායක මාවත, ගාල්ල** යන ලිපිනයට **2025.07.16** දින **ප.ව.4.00** ට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු වේ.

2. අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් හා පළපුරුද්ද සඳහන් නොකිරීම හා අදාළ සහතිකවල ඡායා පිටපත් අමුණා නොතිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

3. කිසියම් හේතුවක් මත යම් අයදුම්පතක් ප්‍රතික්ෂේප වුවහොත් එම අයදුම්පත නැවත සලකා බලනු නොලැබේ.

**සභාපති,**
**රුහුණු සංචාරක කාර්යාංශය,**
**අංක 153 බී,**
**එස්.එච්. දහනායක මාවත,**
**ගාල්ල.**
**2025.06.23**

**වෙබ් අඩවිය - www.southernsrilanka.lk**
**Face Book සබැඳිය - https://facebook.com/RuhunuTouristBureau**